අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Education, Science and Technology
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/104/04/74 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2024.1 1. 18

**චක්‍රලේඛ අංක : 34/2024**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම පරිවේණාධිපතිවරුන්

සියලු ම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්

සියලු ම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්

සියලු ම උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන්

**ද්විතීයික ශ්‍රේණි (6-11) සඳහා ද්විභාෂා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම.**

ද්විතීයික ශ්‍රේණි (6-11) සඳහා ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ අත්සනින් යුතුව නිකුත් කර ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2008/12 හා 2008.04.21 දිනැති චක්‍රලේඛයේ අංක 4 යටතෙහි සඳහන් ව ඇති ද්විභාෂා පන්ති පැවැත්වීමට අදාළ කරුණු සංශෝධනය කර මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ. ඒ අනුව ද්විභාෂා අධ්‍යාපනය හා සම්බන්ධයෙන් මින් ඉදිරියට මෙම චක්‍රලේඛය බලපැවැත්වේ.

**1.0 ද්විභාෂා පන්ති හැඳින්වීම.**

(1.1 ) 2008/12 චක්‍රලේඛයේ 4.2 ඡේදයේ දැක්වෙන පරිදි ඉංග්‍රීසි භාෂාවේ අවශ්‍යතාව හා වැදගත්කම සැලකිල්ලට ගෙන 2002 වර්ෂයේ සිට 6-11 ශ්‍රේණි සඳහා ඇතැම් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට ඒ සඳහා අවශ්‍ය පහසුකම් පවතින පාසල්වලට අවසර දෙන ලදි.

(1.2) 6 -11 ශ්‍රේණි සඳහා සමහර විෂයයන් සිංහල/දෙමළ භාෂාවෙන් ද තෝරාගත් විෂයයන් කිහිපයක් ඉංග්‍රීසි භාෂාවෙන් ද එකම පන්තියේ (මාධ්‍ය දෙකකින් / ද්වි මාධ්‍යයෙන් ) ඉගැන්වීම ද්වි භාෂා පන්ති වශයෙන් හැඳින්වේ. ඒ අනුව මෙම චක්‍රලේඛයේ 3.1.1 හා 3.1.2 හි සඳහන් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.



ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

## 2.0 ද්විභාෂා පන්ති සඳහා සිසුන් තෝරා ගැනීම

2.1 6 ශ්‍රේණියේ සිට ද්විභාෂා පන්ති ආරම්භ කිරීමේ දී ද්විභාෂා අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව 25ට අඩු නම් ද්විභාෂා පන්ති වශයෙන් පන්ති පවත්වා ගෙන යෑම සිදු කළ යුතු ය. එහි දී සිංහල හෝ දෙමළ මාධ්‍ය හෝ සිසුන් සමඟ ද්විභාෂා අධ්‍යාපනය හදාරන සිසුන් ද එකම පන්තියේ අධ්‍යාපනය ලැබිය යුතු අතර අදාළ විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා අවස්ථාවල දී ඊට අදාළ ව ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැලසිය යුතු ය. එහෙත් ද්විභාෂා ඉගෙනුම් අවස්ථා ඉල්ලුම් කරන ශිෂ්‍ය සංඛ්‍යාව 25ට වැඩි වූ අවස්ථාවල දී ද්විභාෂා සිසුන් පමණක් ඇතුළත් කර වෙන ම පන්ති කාමරයක් වශයෙන් පවත්වා ගෙන යෑමට කටයුතු කළ හැකි ය. මේ හා සම්බන්ධයෙන් අදාළ පාසල් කාලසටහන සකස් කර ගැනීම විදුහල්පතිගේ වගකීම වේ. 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. තෝරා ගත් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනීම සඳහා සිසුන් තෝරා ගත යුත්තේ 6 ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් අතරිනි. පාසලට ඇතුළුවීම සඳහා සුදුසුකමක් ලෙස ද්විභාෂා අධ්‍යාපනය ලැබීම යන හේතුව අදාළ නොවේ.

2.2 අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා නිර්දේශ කර ඇති ක්‍රමවේදයට අනුකූල ව පමණක් යම් පාසලක 6 ශ්‍රේණියට ඇතුළත් වූ සියලු ම සිසුන් අතුරින් ද්විභාෂා අධ්‍යාපනය සඳහා සිසුන් තෝරා ගත යුතු ය.

2.3 යම් කිසි හේතුවක් මත 7 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයෙකු ඉගෙනුම් මාධ්‍ය වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කරන්නේ නම් එම ඉල්ලීම පාසලෙහි ද්විභාෂා අධ්‍යාපන සම්බන්ධීකරණ ගුරුභවතාගේ නිර්දේශය සැලකිල්ලට ගෙන විදුහලේ විදුහල්පතිවරයා විසින් පාසල තුළ කළමනාකරණ කමිටුව වෙත යොමු කළ යුතු ය. කමිටුව විසින් අදාළ ශිෂ්‍යයාගේ සාධන මට්ටම හා අධ්‍යාපන කටයුතු සිදු කිරීමට පාසලේ ඇති ශක්‍යතාව පරීක්ෂා කර අදාළ අනුමැතිය ලබා දිය යුතු ය.

2.4 6 ශ්‍රේණියේ ද්විභාෂා පන්ති ආරම්භ කිරීමේ දී සියලු ම සිසුන් ද්විභාෂා අධ්‍යාපනය ලබා ගැනීමට ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා අවස්ථාව ලබා දිය යුතු ය. එහෙත්, ඉල්ලුමට සරිලන පරිදි ද්විභාෂා අධ්‍යාපනය ලැබීමේ පහසුකම් සැපයිය නොහැකි අවස්ථාවල දී පාසල මුහුණ දෙන කළමනාකරණ ගැටලුවලට විසඳුම් සෙවීම පිණිස තෝරා ගැනීමේ පරීක්ෂණයක් පැවැත්විය හැකි ය. මෙම පරීක්ෂණය පැවැත්වීම සඳහා අධ්‍යයන වර්ෂය මුල දී ම විදුහල්පතිවරුන් විසින්

ද්විභාෂා අධ්‍යාපන සඳහා පවතින ඉල්ලුම විධිමත් ක්‍රමවේද අනුව පුරෝකථනය කරමින් කලාප ද්විභාෂා සම්බන්ධීකරණ නිලධාරියාගේ නිර්දේශයට යටත් ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත් පසුව අදාළ වර්ෂයේ පළමු වාරය ආරම්භයේ දී 6 ශ්‍රේණියට ඇතුළත් වූ සියලු ම සිසුන්ට **එක් පරීක්ෂණයක් පමණක්** පවත්වා සුදුසුකම් සහිත සිසුන් තෝරා ගැනීම සිදු කළ යුතුය. එම පරීක්ෂණය අධ්‍යාපන කලාපයේ ද්විභාෂා සම්බන්ධීකරණ නිලධාරියාගේ අධීක්ෂණය හා නියාමනය යටතේ පැවැත්විය යුතු ය.

## 3.0 ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වෙන විෂයයන්

3.1 2024 වර්ෂයේ සිට ද්විතියික ශ්‍රේණිවල (6-11) ද්වි භාෂා පන්තිවල උගන්වනු ලබන විෂයයන් සඳහා මින් ඉදිරියට පහත සඳහන් විධිවිධාන බල පැවැත්වේ.

### 3.1.1 කනිෂ්ඨ ද්විතියික (6-9) ශ්‍රේණි සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට හැකි විෂයයන්

I. ගණිතය
II. විද්‍යාව
III. ඉතිහාසය
IV. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
V. සෞන්දර්යය විෂයයන් යටතේ අපරදිග සංගීතය
VI. භූගෝල විද්‍යාව
VII. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය
VIII. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

පාසලේ පවතින මානව හා භෞතික සම්පත් කළමනාකරණය කර ගැනීමේ පහසුකම මත ඉහත සඳහන් විෂයයන් අතුරින් එක් විෂයයක් හෝ විෂයයන් අවශ්‍ය ප්‍රමාණයක් හෝ තෝරා ගැනීමට හැකි ය.

### 3.1.2 ජ්‍යෙෂ්ඨ ද්විතීයික 10-11 ශ්‍රේණි සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට හැකි විෂයයන්

**හර විෂයයන් යටතේ**

I. ගණිතය
II. විද්‍යාව
III. ඉතිහාසය

**කාණ්ඩ විෂයයන් යටතේ**

I. භූගෝල විද්‍යාව
II. පුරවැසි අධ්‍යාපනය
III. ව්‍යවසායකත්ව අධ්‍යයනය
IV. සංගීතය (අපරදිග)
V. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
VI. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
VII. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
VIII. කෘෂි හා ආහාර තාක්ෂණය
IX. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
X. ගෘහ ආර්ථික විද්‍යාව

පාසලේ තිබෙන භෞතික හා මානව සම්පත් කළමනාකරණය කර ගැනීමේ පහසුකම මත ඉහත සඳහන් විෂයයන් අතුරින් එක් විෂයයක් හෝ විෂයයන් අවශ්‍ය ප්‍රමාණයක් හෝ තෝරා ගැනීමට හැකි ය.

**3.2 අංක 3.1.1 හා 3.1.2හි සඳහන් සීමාවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටින පෞද්ගලික අයදුම්කරුවන්ට බල නොපැවැත්වේ.**

4.0 පාසලේ පවතින මානව හා භෞතික සම්පත් කළමනාකරණය කර ගැනීමේ හැකියාව යටතේ ඉහත සඳහන් විෂයයන් අතුරින් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් හෝ සියලු ම විෂයයන් හෝ තෝරා ගැනීමට අවස්ථාව සලසා දිය යුතු ය. මේ අනුව, තෝරා ගත් විෂයයන් පිළිබඳ ව පළාත්/කලාප සම්බන්ධීකරණ නිලධාරින් මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විභාෂා ශාඛාව දැනුවත් කළ යුතු ය.

අංක 3.1.1 හා 3.1.2හි සඳහන් සීමාවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටින පෞද්ගලික අයදුම්කරුවන්ට බල නොපැවැත්වේ.

**5.0 ද්විභාෂා පන්ති ක්‍රියාත්මක කිරීමේ දී අනුමැතිය ලබා ගත යුතු අවස්ථා**

I. අලුතින් ද්විභාෂා පන්ති ආරම්භ කිරීමේ දී,
II. අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍ය පන්ති ආරම්භ කිරීමේ දී,
III. ද්විභාෂා ප්‍රවේශය යටතේ නව විෂයයන් හඳුන්වාදීමේ දී,
IV. ද්විභාෂා අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම සඳහා දැනට පාසල්වල පවතින සමාන්තර පන්ති සංඛ්‍යාව වැඩි කළ යුතු අවස්ථාවල දී,
V. මෙතෙක් පාසල තුළ පවත්වා ගෙන යනු ලබන ද්විභාෂා පන්ති සම්බන්ධව ගැටළු සහගත අවස්ථා වලදී,

VI. දැනට ක්‍රියාත්මක ව පවතින ද්විභාෂා පන්ති සංඛ්‍යාව යම්කිසි හේතුවක් මත අඩු හෝ වැඩි කරන අවස්ථාවල දී (සමාන්තර පන්ති සංඛ්‍යාව එලෙසම පවත්වාගෙන යන අතරතුරදී)

### 5.1 අනුමැතිය

I. ජාතික පාසලක් නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිත ව ව්‍යුහ කමිටු අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යාපන ලේකම් වෙත යොමු කළ යුතු ය.

II. පළාත් පාසලක් නම් කලාප සහ පළාත් ව්‍යුහ කමිටු අනුමැතිය ලබාගෙන පළාත් ද්විභාෂා සම්බන්ධීකරණ නිලධාරියා මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විභාෂා අධ්‍යාපන ශාඛාව දැනුවත් කළ යුතු ය.

## 6.0 ද්විභාෂා සිසුන් අ.පො.ස (සා.පෙළ) විභාගයට ඉල්ලුම් කිරීම.

අදාළ සිසු සිසුවියන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂයයන් කිහිපයක් ඉගෙන ගනු ලැබුව ද පාසල් අයදුම්කරුවන් වශයෙන් අ.පො.ස. (සා.පෙ) විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී සිසු සිසුවියන්ගේ අභිමතය පරිදි විෂයයන් කිහිපයක් හෝ එක් විෂයයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉල්ලුම් කළ හැකි ය. විභාගයට අයදුම් කිරීමෙන් පසු ඉල්ලුම් කරනු ලබන මාධ්‍ය වෙනස් කිරීමට අවකාශ නොලැබේ.

මෙම චක්‍රලේඛය, අදාළ අනෙකුත් චක්‍රලේඛවල විධි විධාන ද ඇතුලත්ව පාසල්වල නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීමට හා එසේ නොවන අවස්ථාවල දී සුදුසු පියවර ගැනීමට කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වග බලා ගත යුතු ය. මේ සඳහා කලාප හා පළාත් ද්විභාෂා අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරින්ගේ සහාය ලබා ගත යුතු වේ.

2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත උපදෙස් මත කටයුතු කළ යුතු ය.

Jayasundara

ජේ. එම්. තිලකා ජයසුන්දර

ලේකම්

**පිටපත්**

1. සභාපති,ජාතික අධ්‍යාපන කොමිෂම - දැ.ගැ.ස
2. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - දැ.ගැ.ස
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය - අවශ්‍ය කටයුතු සඳහා
4. විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා
6. අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්/ජාතික පාසල්/ගුරුමාරු / ද්විභාෂා අධ්‍යාපන) - අවශ්‍ය කටයුතු සඳහා
7. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), විද්‍යාපීඨ ශාඛාව - අවශ්‍ය කටයුතු සඳහා